# වාර්තා චිත්‍රපටකරණය වෘත්තාන්ත සිනමාවට ප්‍රවේශයක් ද යන්න ලෙස්ටර් ජේම්ස් පීරිස්ගේ සිනමා සම්ප්‍රාප්තිය ඇසුරෙන් විමසා බැලීමක්

ඒ. එම්. ටී. ඩී අබේසිංහ
deepthikaabeysinghe@gmail.com

**සාරසංක්ෂේපය**

දේශීය සිනමාවේ ගමන් මග තීන්දු කිරීමේ ප්‍රමුඛ සාධකයක් ලෙස සැලකෙන ලෙස්ටර්, මෙරට මුල් කාලීන වාර්තා චිත්‍රපටකරණයෙහි ලාංකේය මුද්‍රාව ගවේෂණය කළ අයෙකි. ඒ බව සනාථ වන්නේ රජයේ චිත්‍රපට ඒකකය තුළ රැල්ෆ් කීන් යටතේ සහය අධ්‍යක්ෂවරයෙකු ලෙස ප්‍රමුඛ නිර්මාණ දායකත්වයක් එක් කළ ලංකා උරුමය (Heritage of Lanka - 1951) සහ නෙළුම්ගම (1934) යන චිත්‍රපට මගිනි. ලෙස්ටර් විසින් නිර්මාණය කරන ලද වියළි කලාපය ජය ගැනීම (Conquest in the dry zone -1954) සහ ප්‍රවේසම් වෙනු නැතිනම් තැවෙනු (Be safe or be sorry -1955) යන චිත්‍රපටවල දී කැමරාව එළිමහනට රැගෙන ගොස් සූර්යාවලෝකය යටතේ රූපගතකරණය මැනවින් අභ්‍යාස කොට ඇත. ලෙස්ටර්ගේ වාර්තා චිත්‍රපටකරණය වෘත්තාන්ත සිනමාවට ප්‍රවේශයක් ද යන්න මෙහි දී අධ්‍යයනයට ලක්කොට ඇත. චිත්‍රපටකරණය සඳහා පූර්වගාමී ප්‍රවේශ මාර්ගයක් ලෙස වාර්තා චිත්‍රපටය වැදගත් වන්නේ ද යන්න ලෙස්ටර් ජේම්ස් පීරිස්ගේ සිනමා සම්ප්‍රාප්තිය ඇසුරෙන් හඳුනාගැනීම මෙහි පර්යේෂණ ගැටලුව වේ. වෘත්තාන්ත චිත්‍රපටකරණයට එළඹීමට පෙරාතුව ලෙස්ටර් විසින් රජයේ චිත්‍රපට අංශය සඳහා නිපදවන ලද වාර්තා චිත්‍රපටවල ගැමි දිවිය හා පරිසරය අරුත් ගැන්වූ ආකාරය සංසන්දනාත්මක අධ්‍යයනයකට පාත්‍ර කිරීම මෙහි පර්යේෂණ ක්‍රමවේදය වේ. රැල්ෆ් කීන්ගේ මග පෙන්වීම යටතේ ලත් තාක්ෂණික නිපුණත්වයත්, ලාංකික ජන සමාජයේ සැබෑ ස්වරූපය පිළිබඳ තමාගේම නිරීක්ෂණ හා අවබෝධයත්, දේශීයත්වය මුල් කොටගත් වෘත්තාන්ත චිත්‍රපටයකට මග පෙන්වූ බව ලෙස්ටර්ගේ ප්‍රකාශ මෙන් ම පළමු වෘත්තාන්ත චිත්‍රපටය (රේඛාව - 1956) හා ඉන් පෙර නිර්මාණය කළ වාර්තා චිත්‍රපට අතර වන අනුරූපණය තුලනාත්මකව සලකා බලන කල සනාථ වේ. අගනුවර උසස් යැයි සම්මත ජන සමාජයේ උපත ලබා බටහිර පන්නයට හැදී වැඩුණු ඔහු දේශීය ජන ජීවිතය, සාම්ප්‍රදායික කලා මාධ්‍ය, ලාංකේය පරිසරය ඇසුරෙහි අත්දැකීම් හා ජීවිතාවබෝධය නොලත් අයෙකු බව ලෙස්ටර් චරිතය ඇසුරු කොටගත් ග්‍රන්ථගත මූලාශ්‍රය මගින් හෙළිදරව් වේ. එකී සාධකවලට අනුව මෙරට පරිසරය හා ජන ජීවිතය පදනම් කොටගත් වෘත්තාන්ත සිනමාවකට ඔහු අවකාශ උදා කර ගත්තේ වාර්තා චිත්‍රපටකරණයෙන් ලද තාක්ෂණික පරිචය සහ ඊට අන්තර්ගත විෂය විශ්ලේෂණය මගින් ගොඩනංවා ගත් දැනුම් සම්භාරය මත බව මෙම අධ්‍යයනයේ දී අනාවරණය කොටගත හැකි විය.

**ප්‍රමුඛ පදඃ** තාක්ෂණික පරිචය, දේශීයත්වය, ලෙස්ටර්, වාර්තා චිත්‍රපට, වෘත්තාන්ත සිනමාව

# An Inquiry into Whether Documentary Filmmaking Can Be Considered an Approach to Feature Cinema Within the Context of the Cinematic Tradition of Lester James Peries

A.M.T.D Abeysinghe
deepthikaabeysinghe@gmail.com

**Abstract**

Lester, who is considered a leading influence in shaping the course of local cinema, is one of the individuals who explored Sri Lankan themes in early documentary filmmaking within the country. This is evident through his contributions as an assistant director under Ralph Keane in the Government Film Unit, particularly in films like "Heritage of Lanka" (1951) and "Nelumgama" (1934). Lester's films, "Conquest in the Dry Zone" (1954) and "Be Safe or Be Sorry" (1955), ventured outdoors and embraced shooting in natural sunlight. This study aims to investigate whether Lester's documentary filmmaking approach served as a precursor to his feature films as part of the cinematic tradition of Lester James Peries. The research methodology involves a comparative analysis of how rural life and the environment were portrayed in Lester's documentaries produced for the government film unit before he embarked on making feature films. The parallels between his first feature film, "Rekhava" (1956), and the documentaries created prior to it align with Lester's assertion that his technical skills acquired under Ralph Keane's guidance, coupled with his own observations and understanding of the authentic Sri Lankan society, paved the way for locally-rooted feature filmmaking. Ultimately, this study reveals that despite Lester's upbringing in a more standard, Westernised society in the capital, he was able to create feature films that authentically represented the environment and people's lives in Sri Lanka, thanks to his technical expertise in documentary filmmaking and his in-depth knowledge gained from analysing the subjects within his documentaries.

**Keywords:** Documentary film, Feature film, Indigenization, Lester, Technical practice